**ශීර්ෂය 155 - පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

**-----------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ). ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට සහතික කළ නොහැක.

(ආ).අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එකතු කරන ලද රු.මිලියන 52.61ක් වූ මුදල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වූ බදු නොවන ආදායම් ලෙස දක්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. | නිවැරදි විය යුතු බව පිළිගනී. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

### (අ). මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (I). මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂය තුළ අත්පත් කරගත් වත්කම් රු.මිලියන 3.75 ක් වූ අතර වර්ෂය තුළ අත්පත් කර ගත් වත්කම් හා වෙනත් මූලධන වියදම රු.මිලියන 12,049.90 ක් විය. ඒ අනුව රු.මිලියන 12,046.15 ක වෙනසක් නිරීක්ෂණය විය. | අමාත්‍යාංශය විසින් පළාත් සභා හා පළාත් පාලන ආයතන වෙනුවෙන් සිදුකරන මූලධන වියදම් සම්බන්ධව විධිමත් වත්කම් පැවරීමක් කළ යුතුය. | ඉදිරියේදී සියලු වත්කම් පිළිබඳ ලේඛනයක් නඩත්තු කිරීමටත්, ඒවා නිවැරදිව පවරා දීමටත් එකඟ වෙමි. |
| (II). ස්ථාවර වත්කම් ලේඛනය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු. 612,698 ක වත්කම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා කළමනාකරණයේ අවධානය යොමු කරවමි. | 2019 වර්ෂයේදී ගිණුම්ගත කර ඇත. |

**(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව වර්ෂයේ මුළු පුනරාවර්තන වියදම රු.මිලියන 922.84 ක් වුවත් මුදල් ප්‍රවාහයේ මෙහෙයුම් වියදම රු.මිලියන 189,094.69 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා කටයුතු කළ යුතුය. | අතපසුවීමකින් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇත. |

## 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (I) **පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතුය. | අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. |

(II) **විගණන විමසුම් ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 452(1) ප්‍රකාරව විගණන විමසුම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 452(1) ප්‍රකාර විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගත යුතුය. | අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. |

(III) **රාජකාරී දුරකථන ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාරව රාජකාරී දුරකථන ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාර 26 වැනි පරිශිෂ්ඨයේ පරිදි රාජකාරී දුරකථන ලේඛනයක් පවත්වා ගත යුතුය. | අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. |

(IV) **ඇප ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. |

(V) **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියලුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුය. | අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. |

(VI) **බැරකම් පිළිබඳ ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. | අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. |

### 1.6.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරිම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිතායයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.6, 3.7 ඡේදවල සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත දැක්වේ.

| **නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 702(3) | කොන්ත්‍රාත් ගිවිසුම පිටපත් 3 කින් අත්සන් කර විගණකාධිපතිවරයා වෙත පිටපතක් ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | දැනටමත් නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) ප්‍රාග්ධන වැය විෂයයන් 7 කට අදාළ මුළු ප්‍රතිපාදනය වන රු.මිලියන 154.18 ම ඉතිරි වී තිබුණි. | නියමිත පරිදි ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | රාජ්‍ය අමාත්‍ය කාර්යාලය ක්‍රියාත්මක නොවීම ඇතුළු විවිධ හේතු මත ප්‍රතිපාදන ඉතිරි විය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාග්ධන වැය විෂයයන් 19 කට අදාළව රු.මිලියන 1,702 ක් ඉතිරිව තිබූ අතර එහි ප්‍රතිශතය සියයට 20 ත් සියයට 98 ත් අතර පරාසයක් ගෙන තිබුණි. | එම. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් හා අක්මුදල් නොලැබීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | ----------------------- | ------------ | ------------------------------ |
| (අ) | වැය විෂයයන් 5 ක ප්‍රතිපාදන රු.මිලියන 618.27 සීමාව ඉක්මවා රු.මිලියන 1,550.96 ක බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අයවැය ප්‍රතිපාදන ඉතිරියට වඩා බැරකම් වටිනාකම ඉක්මවා ඇති බව පිළිගනිමි. එයට හේතුව වර්ෂය අවසානයේ බිල්පත් පියවීමට ප්‍රමාණවත් අක්මුදල් නොලැබීමයි. |
| (ආ) | කොන්ත්‍රාත් ගිවිසුම් මත එළඹ තිබුණු රු.මිලියන 19.63 ක බැඳීම් විසර්ජන ගිණුමට ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. | අදාළ අංශවලින් නියමිත තොරතුරු එවා නොතිබුණි. |

**2.3 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වර්ෂ දෙකට වැඩි තැන්පතු ආදායම් ගිණුමට බැර කළ යුතු නමුත් වර්ෂ දෙකට වැඩි රු. 185,356 ක තැන්පත් මුදල් ආදායම් ගිණුමට බැරකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කටයුතු කරමින් පවතී. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 දැක්ම හා මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශයෙන් ඉටුවිය යුතු කාර්යභාරය සිදුකිරීමෙන් පසු අපේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් වන පරිදි දැක්ම හා මෙහෙවර පිළියෙල කර නොතිබුණි. | අමාත්‍යාංශයෙන් ඉටුවිය යුතු කාර්යභාරය සිදුකිරීමෙන් පසු අපේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් වන පරිදි දැක්ම හා මෙහෙවර පිළියෙල කළ යුතුය. | අමාත්‍යාංශයෙන් ඉටුවිය යුතු කාර්යභාරය සිදු කිරීමෙන් පසු අපේක්ෂිත ප්‍රතිලාභ පිළිබිඹු වන පරිදි අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර දැනටමත් පිළියෙල කර ඇත. |

**3.2 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පුරනැගුම ව්‍යාපෘතියේ උප ව්‍යාපෘති 10 ක් සහ නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ කාර්යයන් 4 ක් ආරම්භ කර නොතිබුණු අතර කාර්යයන් 6 ක් ළඟාකර ගත් ප්‍රතිශතය අවම මට්ටමක පැවතුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. | අපේක්ෂිත ප්‍රගතිය ලබාගෙන ඇත. |

**3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (I) 2014 සිට 2016 දක්වා රු.මිලියන 449.48 ක් වැය කර පුරනැගුම ව්‍යාපෘතිය මගින් ඉදිකරන ලද ඉදිකිරීම් 14 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් විවිධ හේතු මත නිශ්කාර්යව පැවතුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය. | මින් ඉදිකිරීම් 3 ක් දැනටමත් භාවිත කරනු ලබන අතර අනෙකුත් ඉදිකිරීම් භාවිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (II) | පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ඌව, බස්නාහිර හා මධ්‍යම යන පළාත්වල රු. මිලියන 75.37 ක් වැය කරමින්, ඉදිකිරීම් නිමකර ප්‍රාදේශීය සභා වෙත භාර දී ඇති ගොඩනැගිලි 3කට ඇතුළත් සතිපොළ, රැස්වීම් ශාලා සහ සෞඛ්‍ය සායනවලට අදාළ කොටස් බලාපොරොත්තු වූ අරමුණු සඳහා යොදවා නොතිබුණි. | නියමිත අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | මන්ත්‍රී සංඛ්‍යාව පුළුල් වීම මත සභා ගැබ ලෙස රැස්වීම් ශාලාව භාවිත කරනු ලබන අතර බණ්ඩාරවෙල එළවළු නිෂ්පාදනය පහළ යාම නිසා සතිපොළ ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. |
| (III) | පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 435.04 ක් වැය කර ප්‍රාදේශීය සභා 9 සඳහා ඉදිකර භාර දෙන ලද මහජන සුබසාධනය සඳහා වූ බහුකාර්ය ගොඩනැගිලි 9 අපේක්ෂිත කාර්යයන් සඳහා නොයොදවා ප්‍රාදේශීය සභා කාර්යාල පවත්වාගෙන යාමට භාවිත කර තිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධුර වැඩිවීම මත සභා සතු ගොඩනැගිලිවල ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කාර්යාලය පවත්වා ගැනීමට සිදු වී ඇත. |
| (IV) | මධ්‍යම පළාතේ උඩ පළාත ප්‍රාදේශීය සභාවේ ජල සැපයුම් ව්‍යාපෘතියට අදාළ කාර්යයන් යටතේ පැවති ජල සම්පාදන ක්‍රමය වැඩිදියුණු කිරීම සඳහා 2017 ජූනි 30 දින වන විට රු.මිලියන 208.53 ක් වැය කර තිබුණි. කෙසේ වුව ද කොන්ත්‍රාත්කරුවන් විසින් 2018 වර්ෂය අවසානයේ ජල සැපයුම් ව්‍යාපෘති අදාළ ප්‍රාදේශීය සභාව වෙත භාරදීමට කටයුතු කර තිබුණ ද ජල සැපයුමේ වර්ධනයක් හෝ පාරිභෝගික සංඛ්‍යාවේ වර්ධනයක් සිදු වී නොතිබුණි. | ප්‍රතිලාභ ලැබෙන පරිදි කටයුතු කළ යුතුය. | ප්‍රමාණාත්මක වර්ධනයක් සිදු නොවුණ ද ගුණාත්මක අතින් උසස් පානීය ජලය ලබා දීමට හැකි වී ඇත. |

**3.4** වයාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති 6ක් රු.මිලියන 121.8 ක් වියදම් දැරීමෙන් පසු ඉදිකිරීම් නිම නොකර අත්හැර දමා තිබුණි. | ව්‍යාපෘති නිමකර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | ඉදිකිරීමට අවශ්‍ය පරීක්ෂණ කටයුතු අවසන් නොවීම, ප්‍රතිපාදන වෙන් නොවීම, ඉඩම් නිදහස් නොවීම හා මහජන විරෝධතා හේතුවෙන් අත්හැර දමා තිබුණි. |

**3.5** ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පූජාභූමි ආශ්‍රිතව සනීපාරක්ෂක පහසුකම් මධ්‍යස්ථාන ඉදිකිරීම, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා පළාත් පාලන අංශය යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන් 04 ක් ද, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශය යටතේ ඌව පළාත, බස්නාහිර පළාත, උතුරු පළාත හා දකුණු පළාතේ කවෂිමා යන්ත්‍ර ස්ථාපිත කිරීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම ද, පළාත් පාලන ආයතන සඳහා කම්පැක්ටර් සැපයීම ද, පුරනැගුම ව්‍යාපෘතිය යටතේ උප ව්‍යාපෘති 05ක් සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා උපදේශකයන් තෝරා ගැනීම ද ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රමාද වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව නියමිත කාල වකවානුව තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය, ප්‍රතිපාදන නොමැති වීම හා මහජන විරෝධතා හේතුවෙන් ප්‍රමාද වී ඇති නමුත් මෙම වසරේදී ක්‍රියාත්මක කෙරේ. |

## 3.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

---------------------------------

වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ඇතුළත් නිරවද්‍ය නොවූ තොරතුරු හා ඒ සම්බන්ධයෙන් වන විගණන නිරීක්ෂණය පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුව ද එසේ සිදුකර නොතිබුණි. | නියමිත දින වකවානු තුළ වාර්ෂික කාර්යසාධන වාර්තාව සභාගත කළ යුතුය. | නියමිත දින වකවානු තුළ සභාගත කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 3.7 විදේශ ආධාර ව්‍යාපෘති

------------------------

විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

**(I). ගිණුම් ඉදිරිපත් නොකළ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 626 අනුව විදේශාධාර ව්‍යාපෘතිවල වාර්ෂික ගිණුම් ඉදිරිපත් කළ යුතු වුව ද 2014 වර්ෂයේ ආරම්භ කළ ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියේ ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර වැය විෂයයන් 4 ක් යටතේ සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 5,816.67 ක් වැය කර තිබුණි. | නියමිත පරිදි ගිණුම් ඉදිරිපත් කළ යුතුය. | නියමිත පරිදි ගිණුම් පොත්පත් පවත්වා ගොස් ඇති බැවින් ගිණුම් ඉදිරිපත් කළ හැකිය. |

**(II) ප්‍රමාණවත් ප්‍රගතියක් අත්කර නොගත් ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයේ ණය ආධාර යටතේ නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විදේශ ණය රු. මිලියන 700 ක් හා දේශීය අරමුදල් රු.මිලියන 80 ක් වශයෙන් රු.මිලියන 780 ක් වෙන් කර තිබුණි. වර්ෂය තුළ ව්‍යාපෘති කාර්යයන්වල ප්‍රගතියක් ලබා නොගැනීම හේතුවෙන් විදේශීය ණය මුදල් උපයෝජනය කළ නොහැකි වී තිබුණි. වැටුප් හා පරිපාලන වියදම් ලෙස දේශීය අරමුදල්වලින් රු. මිලියන 58.7 ක් වැයකර තිබුණි. | නියමිත පරිදි විදේශාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. | ප්‍රසම්පාදන ප්‍රමාද වීම හා ප්‍රසම්පාදන අභියාචන හේතුවෙන් උපදේශක සමාගම පත්කර ගැනීමේ ප්‍රමාදය නිසා ක්‍රියාත්මක කළ නොහැකි විය. |

## 3.8 වත්කම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ක්‍රීඩා අමාත්‍යාංශයට හා පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට අයත් වාහන 2 ක අයිතිය පවරාගෙන නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | අවශ්‍ය ලියකියවිලි මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇත. |
| (ආ) අමාත්‍යාංශය විසින් සමාජ සුබසාධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයට හා ජනාධිපති කාර්යාලයට වාහන 5 ක් ලබා දී තිබුණි. | වාහන අමාත්‍යාංශයට ලබා ගැනීමට කටයුතු කිරීම හෝ පවරා දීම කළ යුතුය. | අයිතිය පවරා ගන්නා ලෙස ලිඛිතව දැනුම් දී ඇත. |

## 3.9 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව ඇප තැබිය යුතු, රජයේ මුදල් හෝ බඩුබාහිරාදිය භාරගැනීම හෝ භාරව සිටින නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුය. | අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

## 3.10 කළමනාකරණ දුර්වලතා

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත පළාත් මට්ටමෙන් ස්ථාපනය කිරීම සඳහා කොම්පෝස්ට් නිෂ්පාදන යන්ත්‍ර 9 ක් රු.මිලියන 935.69 කට සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණි. ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මිලදී ගැනීම, 2017 වර්ෂයේ මිලදීගත් යන්ත්‍ර භාවිතයට නොගැනීම, උතුර, ඌව හා බස්නාහිර යන පළාත්වල ඉඩම් නිරවුල් නොවීම හේතුවෙන් යන්ත්‍ර සවිකිරීමට නොහැකි වීම, කොම්පෝස්ට් පොහොර කිලෝ එකක විකුණුම් මිල රු.20 ක් ලෙස සඳහන් කර තිබුණ ද සැබෑ මිල ශත 36 ක් වීම හේතුවෙන් අපේක්ෂිත ආදායම නොලැබීම, ඇස්තමේන්තුගත ආදායම නිවැරදි නොවීම, එකතු කරනු ලබන කසළ පිළිබඳ ප්‍රමාණාත්මක අධ්‍යයනයකින් පසුව යන්ත්‍ර සවි කිරීමට කටයුතු නොකිරීම, කෑගල්ල නගර සහා ප්‍රදේශයේ නිර්දේශිත ගොඩනැගිල්ල ඉදිකිරීමට ප්‍රමාණවත් ඉඩකඩ | නව ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ප්‍රථම ශක්‍යතා අධ්‍යයනයක් කිරීමට කටයුතු කළ යුතු අතර මිලදී ගත් යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම හා අපේක්ෂිත ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. | ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයේ අනුග්‍රහය මත නියැදියක් ලෙස මෙරටට ලබා දුන් කවෂිමා යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව වසරක පමණ කාලයක් සිදුකළ අධ්‍යයනයකින් පසුව මෙම යන්ත්‍ර මිලදී ගත් අතර පසුව පැන නැගුණු මහජන විරෝධතා හේතුවෙන් යන්ත්‍ර සවිකිරීම ප්‍රමාද වුවත් ඉදිරියේදී යන්ත්‍ර සියල්ල ම ප්‍රයෝජනයට ගත හැකි වේ. අපේක්ෂිත ආදායම උපයා ගැනීම සඳහා දැනටමත් සැලසුම් කර ඇති අතර කොම්පෝස්ට් මිල |

| | | | |
|---|---|---|---|
| | රහිත ස්ථානයක යන්ත්‍රය ස්ථානගත කිරීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය. | | ඉදිරියේදී වැඩිකිරීමට ද අපේක්ෂිත ය. |
| (ආ) | විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 වගන්තිය අනුව හා මුදල් අමාත්‍යාංශයේ MF5/ERD/CP/17/60 හා 2017 මාර්තු 27 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් ඉදිරිපත් කළ නිරීක්ෂණ අනුව මුදලට උපරිම ඵලදායකත්වයක් සහතික වනු පිණිස ජාත්‍යන්තර තරඟකාරී මිල කැඳවීමක් සඳහා යොමු වී නොතිබුණි. | නීතිරීති රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. | ජයිකා ආයතනයේ අනුග්‍රහය යටතේ මෙරටට ලබාදෙන මෙම යන්ත්‍රයේ පේටන්ට් බලපත්‍රය ජපානයේ කෙන්ජි කවශිමා මහතා සතුය. තව ද තරඟකාරී මිල කැඳවීමක් සඳහා එවැනි යන්ත්‍ර ලෝකයේ දන්නා තරමින් නොමැත. එබැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 1.2.1 හි සඳහන් සියලු අවශ්‍යතා සපුරාලීමට මෙමඟින් අවකාශ නැත. කෙසේ වුව ද අදාළ පිරිවිතරයන්ට නීතිරීතිවලට අනුකූලව, විනිවිද භාවයක් ඇතිවන පරිදි අදාළ මිලදී ගැනීම සිදු කර ඇත. |

**3.11** මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාගේ භාවිතය සඳහා 2010 ඔක්තෝම්බර් 25 දින ජනාධිපති කාර්යාලයට අයත් වෙඩි නොවදින ජීප් රථයක් ලබා දී තිබුණි. හිටපු අමාත්‍යවරයාගේ උපදෙස් මත එම වාහනය අලුත්වැඩියාව සඳහා දේශීය නියෝජිත ආයතනය වෙත 2014 ජූනි 11 දින යොමුකර තිබූ අතර, වාහනයේ හානි වී ඇති ඉදිරිපස හා පසුපස වීදුරු අලුතින් දැමීම සඳහා රු.මිලියන 16.22 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. එසේ වුව ද අලුත්වැඩියාව සඳහා රු.මිලියන 3.23 ක බිල්පතක් 2015 සැප්තැම්බර් 30 දිනැතිව ඉදිරිපත් කර තිබුණ ද ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ගෙවීම් සිදුකර නොතිබුණි. මෙම ගෙවීම සිදුකර වාහනය ලබා ගත්ත ද භාවිතයට ගත හැකි තත්ත්වයක නොපවතින අතර එවැනි වාහනයක් භාවිත කිරීමේ අවශ්‍යතාවයක් ද නොවන බව නිරීක්ෂණය වේ. | අලාභහානි සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකිරීම හා වාහනය පවරා දීම සිදු කළ යුතුය. | මෙම ජීප් රථය ජනාධිපති කාර්යාලය වෙත භාර දීමට කටයුතු කරනු ලැබුව ද එම කාර්යාලය මෙතෙක් ඒ සඳහා ඉදිරිපත් වී නැත. |

**4. විගණන හා කළමනාකරණ කමිටුව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 3 ක් පමණක් පැවැත්වුණි. | කාර්තු පදනමෙන් වර්ෂයකට රැස්වීම් 4 ක් පැවැත්විය යුතුය. | නියමිත රැස්වීම් වාර පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ විවිධ තනතුරු 65 ක් සඳහා පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | කටයුතු කරමින් පවතී. |